# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1990/4 – 2016 ඔක්තෝබර් 24 වැනි සඳුදා – 2016.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 253 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/99/FR/380.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ල/ප්‍රාලේ/3/3/5/2/17.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ලග්ගල පල්ලේගම.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ පිටවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ඒ/එල්ජීජී/ 2006/282 හා 2010.02.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.0234 පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගෝනමඩවත්ත (ලග්ගල ගෘෘප්) – ප්‍රමාණය: හෙක්. 2.0234**

උතුරට: අයි. ජී. ඇලිකේවෙල හිමිකම් කියන පතන, ගෝනමඩ වත්ත (ලග්ගල ගෘෘප්); නැගෙනහිරට: රජය හිමිකම් කියන පතන; දකුණට: ටී. ඩී. එන්. මැදගොඩ හිමිකම් කියන පතන, ගෝනමඩවත්ත (ලග්ගල ගෘෘප්); බටහිරට: හිමිකම් කියන අය නොදන්නා ගෝනමඩ වත්ත (ලග්ගල ගෘෘප්).

11 - 384

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2007.05.11 වැනි දින අංක 1496/18 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ* ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2007 අංක 127 හා 2007.05.11 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකයද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2006/CEB/295.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/2/6/4/1/8.
2016 ඔක්තෝබර් මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපනේ කෝරළේ සුළු කොට්ඨාසයේ, නියංගන්දර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක එන්යූ/කේටීඑම්/2006/159 හා 2007.03.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.2833 ක් වූ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වොයිසිවත්ත – ප්‍රමාණය: හෙක්. 0.2833**
උතුරට: වොයිසිවත්තේ ඉතිරි කොටස, ප්‍රගමන අනුරේඛන අංක එන්යූ/එස්ජී/2006/28 හි කැබලි අංක 3; නැගෙනහිරට: වොයිසිවත්තේ ඉතිරි කොටස, ප්‍රගමන අනුරේඛන අංක එන්යූ/එස්ජී/2006/28 හි කැබලි අංක 3; දකුණට සහ බටහිරට: වොයිසිවත්තේ ඉතිරි කොටස.

11 - 385

---

### ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 261 දරන ආඥාව**

අංක 1882/10 හා 2014.09.30 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරුවිධානයට අදාළ 2014 අංක 261 දරන ආඥාවෙහි උපලේඛනයේ කැබලි අක්ෂර Gz හි බටහිර මායිම 'මාර්ගය (මා.සං.අ)' යන්න 'මාර්ගය (මා.සං.අ) සහ කැබලි අක්ෂර Gy ' ලෙසත්, කැබලි අක්ෂර Qs හි ප්‍රමාණය 'හෙක්. 0.0067' යන්න 'හෙක්. 0.0006 ක්' ලෙසත්, කැබලි අක්ෂර Sd හි නැගෙනහිර මායිමේ 'කැබලි අක්ෂර Fs, ඇළ සහ ඩබ්. ජී. හීන්බණ්ඩා හිමිකම් කියන වෙලේගෙදර ඉඩම' යන්න 'කැබලි අක්ෂර Sf, ඇළ සහ ඩබ්.ජී.හීන්බණ්ඩා හිමිකම් කියන වෙලේගෙදර ඉඩම' ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2013/HW/269.
2016 ඔක්තෝබර් මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 386

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.